# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2019.02.15

වේලාව : පෙ.ව. 9.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

| | | | |
|---|---|---|---|
| 1) | ප්‍රදීප් යසරත්න මහතා | - | ප්‍රධාන ලේකම් (බ.ප) |
| 2) | එම්.ජී.ඒ.තිලකරත්න මහතා | - | ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 3) | හේමන්ත සමරකෝන් මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 4) | එස්.ජී.විජයබන්ඩු මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප) |
| 5) | එන්.නිල්වල මහතා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප) |
| 6) | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 7) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 8) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 9) | එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 10) | ඩී.එම්.එන්.දිසානායක මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 11) | ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 12) | ඔවිනි කේ. විජේවික්‍රම මිය | - | ජ්‍යෙ. සහ. ලේකම් (පළාත් පාලන අමාත්‍යාංශය-බ.ප) |
| 13) | පාලිත නානායක්කාර මහතා | - | පළාත් පාලන කොමසාරිස් (බ.ප) |
| 14) | පේෂලාආර්. අබේසූරියමිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | පාලිතඅබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරි |
| 17) | ආර්.එම්.ඩී.පී.කුමාරිමිය | - | සහකාරලේකම් (ප්‍රවාහනඅමාත්‍යාංශය-බ.ප) |
| 18) | එස්.එම්.එන්. සුබසිංහ මිය | - | සහකාර අධ්‍යක්ෂ, පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 19) | ටකයාකිනගායි මහතා | - | ජයිකා ආයතනය |
| 20) | ආර්.පී.සමරක්කොඩි මහතා | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 21) | සාලිය ඩයස් මහතා | - | සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 22) | එච්.ඩී.ජී.ප්‍රියන්ත මහතා | - | සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 23) | ඒ.ඩබ්.පී.මධුභාෂිණී ගුණවර්ධන | - | සෙන්දායි ව්‍යාපෘති සහායක, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| 24) | ඒ.ශානිකා විජේනායක | - | කළමනාකරණ සහකාර, ජයිකා ආයතනය |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | ශ්‍රීලංකාවේ ආපදා කළමනාකරණය සඳහා සෙන්දායි රාමුව 2015-2030 යොදා ගැනීම | ශ්‍රීලංකාවේ ආපදා කළමනාකරණය සඳහා සෙන්දායි රාමුව යොදාගැනීමේ ක්‍රමවේදය පිළිබඳවබස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීමක් ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හාජයිකා ආයතනය ඒකාබද්ධව පැවැත්වූ අතර, එහි දී ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ (DDR) සැලසුම් සකස් කිරීමේ පියවර 8 සම්බන්ධව ද වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී. | - |
| 02. | පළාත් සභා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ තවමත්මිලදීනොගත්අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතන පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් විමසූ අතර,2019 මාර්තු මස අවසන් වන විට අදාලමිලදී ගැනීම් සිදු කළ යුතු බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙනලදී.<br><br>එසේම, භාණ්ඩමිලදීගැනීම් වලටඅදාලවලබා දී ඇති ප්‍රතිපාදන අනුව මිලදී ගැනීම්වලප්‍රගතිය සොයාබැලියයුතු බව ද ප්‍රධානලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 03. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාව ආරම්භ කිරීම | පෙබරවාරි මස 25 වන විට ආපන ශාලාව ආරම්භ කළ හැකි බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br><br>මන්ත්‍රී භෝජනාගාරයවෙනුවෙන් වෙන් කර ඇති කොටස සඳහා මේස සහ පුටු රාජ්‍යදැව සංස්ථාවෙන්මිලදී ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් සභා ලේකම් වෙත දන්වන ලදී. | සභා ලේකම් |
| 04. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධව | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධ යෝජනාව සඳහාඅමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 05. | බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 03 පාදක කරගෙනDriveThrough බලපත්‍ර ලබා ගැනීමේ ස්ථාන පිහිටුවීම | DriveThrough බලපත්‍ර ලබා ගැනීමේ ස්ථාන පිහිටුවීම වෙනුවෙන්කොළඹ දිස්ත්‍රික්කයසඳහා කොළඹ සහ කඩුවෙල ප්‍රදේශවලින්ඉදිරිපත් වූඇස්තමේන්තුව ඉංජිනේරු අංශය වෙත ඉදිරිපත් කර ඇති බව ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වෙත දන්වන ලදී<br>ඒ අනුව අනෙකුත් දිස්ත්‍රික්කවලින් ද කඩිනමින්ඇස්තමේන්තු ගෙන්වාගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 06. | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ පාසල් සතිය ප්‍රකාශයට පත් කිරීම | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ පාසල් සතියටසමගාමීව 2019.01.21-28 දක්වා සිදු කළ වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය ඡායාරූප ද සමඟ සති 02ක් ඇතුළත ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |
| 07. | ග්‍රාම ශක්ති ප්‍රගති සමාලෝචනය | අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන "ග්‍රාම ශක්ති ශ්‍රමදාන සතිය සාර්ථකව පැවැත්වෙන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>2019.02.18 දිනදොම්පෙගෝල්ඩන්බීච් හෝටලයේ දී පැවැත්වීමට නියමිතබස්නාහිර පළාත් ග්‍රාම ශක්ති ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සියලුමඅමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානින්හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු පැමිණිය යුතු බවත්, ප්‍රධාන ලේකම් විසින් සිහිපත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 08. | අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව මැයෙන් නි.ප්‍රලේ(පි/පු) විසින් යොමු කරන ලද CSWP/PTR/12-3/FI/3 අංක හා 2019.01.21 දිනැතිලිපියේ සඳහන් යෝජනා | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි/සිවිල්/විදුලි/ යාන්ත්‍රික සඳහාවෙනමසේවයක් ස්ථාපනය කිරීමට අදාලව යෝජිත සේවාව සඳහා සකස් කරන ලද නව සේවා ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නි.ප්‍ර.ලේ(පි/පු), නි.ප්‍ර.ලේ(ඉංජිනේරු), වාරිමාර්ග, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් අතර සාකච්ඡාවක් 2019.02.20 දින ප.ව. 3.00ට සූදානම් කරන ලෙස නි.ප්‍ර.ලේ(පි/පු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 09. | දිසාපතිවරුන් හා ප්‍රධාන ලේකම්වරුන්ගේරැස්වීම | අමාත්‍යාංශ විෂය පථ වෙනස් වීම හේතුවෙන්'අභ්‍යන්තරහා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය' විසින් දිසාපතිවරුන් හා ප්‍රධාන ලේකම්වරුන්ගේරැස්වීම ඒකාබද්ධ කර පැවැත්වීමට තීරණය කළ අතර, එම රැස්වීම කල් ගිය බැවින්,ඉදිරියේදී පැවැත්වෙන උක්ත රැස්වීම සඳහාදිස්ත්‍රික් ලේකම්වරු සමඟ සාකච්ඡා කළ යුතු කරුණු වේ නම්, එම සාකච්ඡාව පැවැත්වීමට පෙර ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | පළාත් සභා ගොඩනැගිල්ලේ වාහන ගාල් කිරීම. | සියලුම ලේකම්වරුන්ගේ වාහන ගාල් කරන ස්ථානවල නාම පුවරු සවි කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නි.ප්‍ර.ලේ(ඉංජිනේරු) වෙත දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වැඩ බැලීම/රාජකාරි ආවරණය සඳහා අනුමැතිය ලබා ගැනීමට ලැබෙන ඉල්ලීම් සම්බන්ධව | මෙ සම්බන්ධව අදාල අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡාවක් සිදු කිරීමේඅවශ්‍යතාවප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 12. | නව ගොඩනැගිල්ලේ නඩත්තු ඒකකය | නව ගොඩනැඟිල්ලේ නඩත්තු ඒකකය සම්බඳාදා දිනකමඉංජිනේරුතලංගම මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බැවින්, ඒ සඳහාමේ වන විට නම් කර ඇති අදාල නිලධාරීන් සහභාගී කරවන ලෙස ප්‍රධාන ලේකම් විසින් සියලුමලේකම්වරුන් වෙත දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | නව ගොඩනැගිල්ල සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම | වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා නව ශ්‍රවණාගාරයේ එක් සාකච්ඡා ශාලාවක් ලබා දීමට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය හිමි විය.එය යෝජිත පරිදි සකස් කර දීමට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)වෙත පවරන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

<u>**නව යෝජනා**</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | ISO විගණනය සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා ISO විගණනයසාර්ථකව සිදු කළ බවප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කළ අතර, ඒ සඳහා සහභාගී වූ සියලුම නිලධාරීන් වෙත ස්තූතිය පළ කරන ලදී.<br>එසේම, අනෙකුත් අමාත්‍යාංශ ද, ISO තත්ත්ව සහතිකය ලබා ගැනීම සඳහා කටයුතු කල යුතු බව ද, ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | විගණන පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන | විගණකාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත "විගණන පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන" 2019.02.26 දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වෙන බැවින්, ඒ සඳහා සියලු මාණ්ඩලික නිලධාරීන් සහභාගි වන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 03. | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය සම්බන්ධ තීරණ | තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියෙහි කටයුතු සම්බන්ධයෙන්ප්‍රධානලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු කරුණු පිළිබඳවනියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) මඟින් යොමු කරන ලෙසත්, ඒ සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු) නිර්දේශ කැඳවීමෙන් අනතුරුව ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 04. | "පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි කටයුතු විධිමත් කිරීම" මැයෙන් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද CM/WP/E6/05-03 (2019) අංක හා 2019.01.30 දිනැති ලිපිය | පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රචාරණය කරනු ලබන පෝස්ටර් හා දැන්වීම් පුවරු සඳහා විධිමත් ක්‍රමවේදයක් මීට පෙර හඳුන්වා දී අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇතත්, ඊටඅනුකූලව කරුණු සිදු නොවන බැවින්, ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී විශේෂ අවධානය යොමු කරපළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් නිකුත් කර ඇති ලිපිය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් රැස්වීමවෙත ඉදිරිපත් කරන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |

ඩබ්ලිව්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධානලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.